සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

බෞද්ධ ශිෂ්ටාචාරය - I

13 ශ්‍රේණිය **කාලය පැය 02 යි.**

- අංක 01 සිට 50 දක්වා වූ ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4), (5) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න.

---

01. බ්‍රාහ්මණ ඉගැන්වීමට බ්‍රාහ්මණ, ක්ෂත්‍රිය, වෛශ්‍ය, ශුද්‍ර යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) වර්ණ ධර්මයයි. (2) ආශ්‍රම ධර්මයයි (3) ස්ව ධර්මයයි
(4) ආපද් ධර්මයයි. (5) නියාම ධර්මයයි.

02. බ්‍රාහ්මණ සම්ප්‍රදාය මගින් කාන්තාවගේ සාමාජික, ආර්ථික, දේශපාලනික මෙන්ම ආගමික නිදහස ද අහිමි කොට තිබුණත් කාන්තාවට අධ්‍යාපනික විමුක්තිය සඳහා ස්ත්‍රීත්වය බාධාවක් නොවන බව බුදුසමය පෙන්වා දෙයි. ඒ බව තහවුරු වන්නේ,

(1) මවක් වශයෙන් වන්දනීය තත්වයක් කාන්තාවන්ට හිමිකර දීමෙනි.
(2) ථේරී ගාථාවල දක්වෙන භික්ෂුණීන්ගේ ප්‍රකාශ වලිනි.
(3) බිරිඳක් වශයෙන් කාන්තාවගේ අයිතිවාසිකම් තහවුරු කර තිබීමෙනි.
(4) බිරිඳ ස්වාමිපුරුෂයාගේ හොඳම මිතුරිය ලෙස හඳුන්වා දීමෙනි.
(5) කාන්තාවන් ඒ ඒ තන්හිදී විචක්ෂණශිලීව ක්‍රියා කරන බව බුදුරදුන් දේශනා කිරීමෙනි.

03. ප්‍රාග් වෛදික යුගයේ පැවති මූලික ආගමික පිළිවෙතක් වූයේ,

(1) ඊශ්වර වන්දනයයි. (2) සතිපූජාවයි
(3) ජගදාත්මය සමඟ එක්වීමට පිළිවෙත් පිරීමයි. (4) ජගන්මාතා වන්දනයයි.
(5) බ්‍රහ්ම සහව්‍යතාවට පත්වීමට පුද පූජා පැවැත්වීමයි.

04. ආශ්‍රම ධර්ම අතරින් බ්‍රහ්මචාරී අවධියේ දී සැපිරිය යුතු මූලික කාර්ය ලෙස අවධාරණය කරනු ලබන්නේ,

(1) ගෘහ ජීවිතය අතහැර බ්‍රහ්මචාරීව විසීමයි.
(2) දිවි ඇතිතාක් බ්‍රහ්මචාරීව විසීමයි.
(3) බ්‍රහ්මචාරීව නිසි අධ්‍යාපනයක් ලබා ගැනීමයි.
(4) බ්‍රහ්මචාරී දිවියෙන් මිදී විවාහ ජීවිතයක් ගත කිරීමයි.
(5) කන්‍යාවියකු ලෙස බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමයි.

05. වෛදික ඉගැන්වීම් වලට අනුව වැන්දඹු බිරිඳක විසින් තම මියගිය ස්වාමියාට කළ යුතු උසස්ම පරිත්‍යාගය ලෙස සලකා ඇත්තේ,

(1) යාගහෝම පැවැත්වීමයි.
(2) දරුවන් රැක බලා ගැනීමයි
(3) ස්වාමියාගේ ඥාති කුලවලට දාසියක් ලෙස සේවය කිරීමයි.
(4) මෙහෙකාර සේවයේ යෙදීමයි
(5) ස්වාමියාගේ මළ සිරුර දැවෙන දර සෑයට පැන ජීවිතය පූජා කිරීමයි.

06. බුද්ධකාලය වනවිට භාරතීය ආගමික සම්ප්‍රදායන් දෙකක් වූයේ බ්‍රාහ්මණ සම්ප්‍රදාය හා ශ්‍රමණ සම්ප්‍රදායයි. මෙයින් ශ්‍රමණ සම්ප්‍රදායේ අනන්‍යතා ලක්ෂණයක් වන්නේ,

(1) බාහිර පුද පූජා මගින් විමුක්තිය ලද හැකි යැයි විශ්වාස කිරීමයි.

(2) ඥාණ මාර්ගීය අනුගමනය කොට තමා විසින් ම විමුක්තිය ලබාගත යුතු වීමයි.

(3) වේදය වැනි ශුද්ධ ග්‍රන්ථ පිළිගැනීමයි.

(4) මිනිසුන් අතර කුලභේදය තිබිය යුතු යැයි පිළිගැනීමයි.

(5) දෙවියන් හා මිනිසුන් අතර සම්බන්ධීකාරක පූජකයකු පිළිගැනීමයි.

07. බුද්ධ කාලීන භාරතයේ භාරුකම්ම වැනි ප්‍රධාන වරායන් ඔස්සේ නැව් මගින් භාණ්ඩ ආයාත නිර්යාත කිරීම ද වැනි සාධක මගින් ප්‍රකට කෙරෙන්නේ,

(1) බුද්ධකාලීන භාරතයේ දියුණු නගර පැවති බවයි.

(2) බුද්ධ කාලීන භාරතයේ භාණ්ඩ ප්‍රවාහනයට ගැල් බහුලව භාවිත කළ බවයි.

(3) බුද්ධ කාලීන භාරතය වාණිජකරණයට ලක් ව පැවති බවයි.

(4) නැව් මගින් භාණ්ඩ ආයාත නිර්යාත කළ බවයි.

(5) බුද්ධ කාලීන භාරතයේ විරැකියාව අවම වූ බවයි.

08. බෞද්ධ විග්‍රහයට අනුව සමාජ පරිණාමය සිදු වී ඇත්තේ,

(1) කර්මානුරූපීවයි (2) දේව නිවර්මාණයක් ලෙසයි (3) නියති පරිණාමයක් ලෙසයි

(4) හේතුඵල වාදීවයි (5) හේතුප්‍රත්‍ය රහිතවයි.

09. සිඟාලෝවාද සූත්‍රයේ දී ස්වාමිපුරුෂයා තම බිරිඳ වෙනුවෙන් යුතුකම් ඉටු කිරීම මගින් ප්‍රකට වනුයේ,

(1) පවුල් ඒකකය තුළ බිරිඳට ගෞරවණීය තත්වයක් හිමිකර දී ඇති බවයි.

(2) මවක් වශයෙන් කාන්තාව පූජණීයත්වයට පත්කොට ඇති බවයි.

(3) පුරුෂයාට මෙන්ම කාන්තාවට විමුක්තිය සඳහා සමාන හැකියාවක් ඇති බවයි.

(4) පවුල තුළ බිරිඳ ස්වාමියාට වඩා උතුම් බවයි.

(5) බිරිඳත්, සැමියාත් සමාන තත්වයකින් සැළකිය යුතු බවයි.

10. පොළොවේ වසන සියලුම සතුන් ඝාතනය කොට එකම මස්ගොඩක් කළේ වී නමුත් ඉන් කිසිදු පාපයක් සිදු නොවන බව ප්‍රකාශ කළේ,

(1) නිගණ්ඨනාත පුත්තය (2) පූර්ණ කස්සපය (3) අජිත කේශ කම්බිලිය

(4) මක්ඛලි ගෝසාලය (5) සංජය බෙල්ලට්ඨී පුත්තය

11. ''සත්වයන්ගේ කෙලෙසීම හෝ විසුද්ධිය පිණිස හේතුඵල සම්බන්ධතාවක් නැත. තමන්ගේ හෝ අනුන්ගේ හෝ යහපත පිණිස කළයුතු දෙයක් නැත. සියලු සත්වයෝ වීර්‍යය බලය, ආත්ම ශක්තිය රහිතයෝය.'' මෙයින් ඉගැන්වෙන ආගමික චින්තාව හඳුන්වන්නේ,

(1) පරම අවිහිංසා වාදය ලෙසයි. (2) පුබ්බේකත හේතුවාදය ලෙසයි.

(3) අහේතු අප්‍රත්‍යවාදය ලෙසයි (4) උච්ඡේදවාදය ලෙසයි

(5) අමරා වික්ඛේප වාදය ලෙසයි.

12. පහත දැක්වෙන නගර අතුරෙන් කෝසල රාජ්‍යයට අයත් නගරයක් වන්නේ,

(1) රජගහ නුවරය. (2) විශාලා මහ නුවරය (3) පැලලුප් නුවරය

(4) සාකේත නුවරය (5) කුසිනාරා නුවරය.

13. සත්වයා සහ ලෝකය සර්ව බලධාරී දෙවියකු විසින් ''මවා පාලනය කරනු ලැබේ.'' යන ප්‍රකාශයෙන් කියවෙන ආගමික ඉගැන්වීම හඳුන්වනු ලබන්නේ,

(1) ඊශ්වර නිර්මාණවාදය යනුවෙනි. (2) අහේතු අප්‍රත්‍යවාදය යනුවෙනි

(3) නියතිවාදය යනුවෙනි. (4) පරිණාම වාදය යනුවෙනි.

(5) ශාස්වත වාදය යනුවෙනි.

14. සුද්ධෝදන, අමිතෝදන යන පුද්ගලනාමයන්ට ''ඕදන'' (බත) යන්න යෙදීම, සුද්ධෝදන රජතුමා සීසෑමේ ජාතික උත්සවයට සහභාගි වීම, භික්ෂූන්ගේ සිවුර මගධ කුඹුරුයායේ ආකෘතිය අනුව සකසා ගැනීම, කසීභාරද්වාජ වැනි බමුණන් පවා සී සෑමේ යෙදී සිටීම. වප්මඟුල් දා සිදුහත් කුමරු ආනාපාන සති භාවනාව වැඩීම යන මෙම කරුණු වලින් පැහැදිලි වන්නේ,

(1) සුද්ධෝදන රජු සීසෑමේ නායකත්වය ගත් බවයි.

(2) වප්මඟුල් දා සිදුහත් බෝසතුන් ආනාපාන භාවනාවේ යෙදී සිටි බවයි.

(3) බමුණන් බවා කෘෂිකර්මාන්තයේ යෙදුන බවයි.

(4) කුඹුරේ ආකෘතියට අනුව භික්ෂූන්ගේ සිවුර සකස් වූ බවයි

(5) බුද්ධකාලීන භාරතයේ දියුණු කෘෂි ආර්ථික රටාවක් පැවති බවයි.

15. පුද්ගල පෞරුෂ වර්ධනයට හා ස්වාධීන චින්තනයට හානි පමුණුවන පුබ්බේකත හේතුවාදය, අහේතු අප්‍රත්‍යවාදය, දේව නිර්මාණ වාදය වැනි ඉගැන්වීම් ප්‍රතික්ෂේප කිරීමට බුදුසමය ඉදිරිපත් කරන්නේ,

(1) කර්මවාදයයි (2) හේතුඵල වාදයයි (3) විභජ්ජවාදයයි

(4) අනාත්ම වාදයයි (5) පරිණාම වාදයයි

16. අතෘප්තිකර ස්වභාවය සමනය කරගෙන තෘප්තිකර සරු දිවි පෙවතකට හුරුවීම,

(1) අල්පේච්ඡතාවයි (2) මහේච්ඡතාවයි (3) බහුකිච්චතාවයි

(4) අල්ප කෘත්‍යතාවයි (5) සුභරතාවයි

17. ''සියලුම සත්වයෝ දඬුවමට, මරණයට බියවෙති. දුකට අකැමැති වෙති. සැප විඳීමට කැමැති වෙති. මෙම ආකල්පයෙන් සතුන් දෙස බලන මිනිසුන් කිසිදින අනුන්ට හිංසා කිරීමටවත්, නැසීමටවත් නොසිතති.'' මෙම බෞද්ධ සදාචාර මූලධර්මය හඳුන්වන්නේ,

(1) ආත්ම හිංසනය වශයෙනි. (2) ආත්ම සංවරය වනුවෙනි.

(3) ආත්ම දමනය වශයෙනි. (4) පරාර්ථ චර්යාව යනුවෙනි.

(5) අත්තූපනායික ධර්මපර්යාය වශයෙනි.

18. යම් පාලකයකු ධර්මයට හා නීතියට වඩා සිය කැමැත්ත අනුව ඥාතීන්ට සංග්‍රහ කිරීම. හිතමිත්‍රාදීන්ට අවනීතියට වැඩ කරන්නට ඉඩ දීම, විරුද්ධ මත දරන්නන් හිංසාවට ලක් කිරීම, තම පාලනය ගිලිහේය යන බිය නිසා හෝ වෙනත් හේතූන් නිසා බියට පත්ව වැරදි තීරණ ගැනීම, මුලාවී නුසුදුසු දෑ කිරීම, මෙබඳු පාලකයකු හැඳින්විය හැක්කේ,

(1) සතර කර්මක්ලේශයෙන් යුතු පාලකයකු ලෙසිනි.

(2) චතුර්විධ මිත්‍ර ප්‍රතිරූපකයන් ඇසුරු කරන පාලකයකු ලෙසිනි.

(3) සතර සම්‍යග් ප්‍රධානයෙන් කටයුතු නොකරන පාලකයකු ලෙසිනි.

(4) සතර අගතියෙන් යුතු පාලකයකු ලෙසිනි.

(5) චතුර්විධ සුබය නොදන්නා පාලකයකු ලෙසිනි.

19. සියලු රට වැසියන්ට පමණක් නොව පක්ෂීන්ට, සිවුපාවුන්ට පවා දැහැමි රැකවරණය සැලසීම, සිය රටෙහි අධාර්මික ක්‍රියා වලට ඉඩ නොතැබීම. දිළිඳු භාවය නැතිකොට ආර්ථික සංවර්ධනය පිණිස කටයුතු කිරීම. සිය රටෙහි වෙසෙන වියත් විශාරද මහණ බමුණන්ගෙන් උපදෙස් ලබා ගෙන දැහැමින් රට පාලනය කිරීම යන කරුණු ආතුලත්වන බෞද්ධ දේශපාලන මූලධර්මය හඳුන්වන්නේ,

(1) සතර සංග්‍රහ වස්තුව නමිනි. (2) සප්ත අපරිහානිය ධර්ම නමිනි.

(3) දස සක්විති වත් නමිනි. (4) දසරාජධර්ම නමිනි.

(5) දසපින්කිරියාවත් නමිනි.

The National e-learning Portal for The General Education

20. ගෘහස්ථ ජීවිතය තුළ සදාචාරාත්මක සීමාව ඉක්මවා කම් සැප නොවිඳිය යුතු බව උගන්වන ශික්ෂා පදය වන්නේ,

(1) ''සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

(2) ''අබ්‍රහ්මචරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' යනුවෙනි.

(3) ''කාමේසු මිච්ඡා චරියා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

(4) ''අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි'' යනුවෙනි.

(5) ''පිසුනාවාචා වේරමණී සික්ඛා පදං සමාදියාමි'' යනුවෙනි.

21. බුදුන් වහන්සේ කිසිම අවස්ථාවක දී අටලෝ දහමින් උද්දාමයට හෝ කම්පාවට පත් නොවී සියල්ල මැදහත්ව විඳ දරා ගත්හ. උන්වහන්සේ තුළ පැවති එකී උත්තරීතර ගුණය හඳුන්වනු ලබන්නේ,

(1) කරුණා ගුණය යනුවෙනි. (2) මෙත්තා ගුණය යනුවෙනි.

(3) අරහං ගුණය යනුවෙනි. (4) තාදි ගුණය යනුවෙනි.

(5) භගවා ගුණය යනුවෙනි.

22. ''මේ දහම් අකුසල්ය. මේ දහම් වරද සහිතය. මේ දහම් නුවණැත්තන් විසින් ගරහන ලද්දේය. මේ දහම් පිළිපැදීමෙන්, සමාදන් වීමෙන් අවැඩ පිණිස දුක් පිණිස පවත්නාහයි යම් කලෙක තෙපි තුමූම දැනගත්තාහු නම් එය දුරුකරම්.'' යනුවෙන් දැක් වෙන බුද්ධානු ශාසනාවෙන් අවධාරණය කෙරෙන්නේ,

(1) බුදු දහම කාලාම සූත්‍රානුගත කුසල් පමණක් කිරීම අගය කළ බවයි.

(2) බුදු දහම නුවණැත්තන් විසින් ගරහන ලදදේ අගය කළ බවයි.

(3) බුදු දහම නිදහස් චින්තනය අගය කළ බවයි.

(4) බුදු දහම කිසිවකුට අවැඩ පිණිස දුක් පිණි සහේතු නොවන දේ කිරීම අගය කළ බවයි.

(5) බුදු දහම අත්තනෝමතික පුද්ගල චින්තනය උසස් යැයි අගය කළ බවයි.

23. පිරිනිවන් පෑමට ආසන්නයේදී බුදුන් වහන්සේ භික්ෂූන් අමතා වදාළේ බුදුන්, දහම්, සඟුන් කෙරෙහි හෝ මාර්ගය කෙරෙහි හෝ නිවන පිළිබඳව හෝ යම් සැකයක් ඇත්නම් විමසා දැනගන්නා ලෙසයි. යමෙක් බුද්ධ ගෞරවය නිසා ප්‍රශ්න නොකරන්නේ නම් යහළුවකු මගින් හෝ කරුණු විමසා දැන ගන්නැයි අවවාද කළහ. මෙයින් ගම්‍ය වන්නේ බුදුරදුන් තුළ පැවති,

(1) ධර්ම ප්‍රචාරයට තිබූ දැඩි කැමැත්තයි. (2) විශිෂ්ට ශාස්තෘත්වයයි

(3) ප්‍රශ්න විසඳීමට තිබූ අසමසම හැකියාවයි. (4) තාදි ගුණයයි.

(5) මහා කාරුණික ගුණයයි.

24. සොහොනක අතරමං කොට දමාගොස් තිබූ සෝපාකට බුදුන් වහන්සේ පිහිට වූ සේක. මින් ප්‍රකට වන්නේ, බුදුන්වහන්සේ තුළ පැවති,

(1) මහා කාරුණික ගුණයයි. (2) පුරිසධම්ම සාරථී ගුණයයි

(3) අරහං ගුණයයි. (4) සත්තා දේවමනුස්සානං ගුණයයි.

(5) මහා ප්‍රඥාවයි.

25. ''අණන'' සූත්‍රයේ විස්තර වන චතුර්විධ සුඛයන් අතර, ''භෝග සුඛ'' යනුවෙන් අදහස් කෙරෙන්නේ,

(1) භවභෝග සම්පත් බහුලව රැස්කර ගැනීමෙන් ලබන සතුටයි.

(2) භෝග වගා කිරීමෙන් ලබන සතුටයි.

(3) දැහැමිව භෝග සම්පත් උපයා ගැනීමෙන් ලබන සතුටයි.

(4) නිවැරදි දිවි පෙවතක් ගතකිරීමෙන් ලබන සතුටයි.

(5) තමා සතු සම්පත් නිසි පරිදි පරිභෝග කිරීමෙන් ලබන සතුටයි.

26. ප්‍රථම සංගීතියට අදාළ මූලික හේතුව වශයෙන් දැක්වෙන්නේ,

(1) දේවදත්ත තෙරුන්ගේ ක්‍රියා කලාපයයි. (2) විනයධර ධර්මධර භික්ෂූන්ගේ අර්බුදයයි.

(3) ඡන්න භික්ෂුවගේ විෂමාචාර පැවැත්මයි. (4) සාති භික්ෂුවගේ විඥානවාදයයි.

(5) සුභද්‍ර භික්ෂුවගේ වගකීම් රහිත ප්‍රකාශයයි.

27. ප්‍රථම ධර්මදූත කණ්ඩායමට අයත් වූයේ,

(1) පස්නමකි. (2) පනස් හතර නමකි. (3) පනස් පස් නමකි.

(4) හැටනමකි. (5) හැට එක් නමකි.

28. ජෛනාගමික ශ්‍රමණ ප්‍රතිපත්තීන්ද, මහජනතාවගේ ඉල්ලීම්ද සැළකිල්ලට ගත් බුදුන් වහන්සේ සංචාරක ධර්ම ප්‍රචාරක ජීවිතයක් ගත කළ භික්ෂු සංඝයාට භාරතයේ එක් ඍතුවක දි සංචාරක ජීවිතය අතහැර ආරාමිකව වාසය කරන්නට අනුදැන වදාළහ. එහිදී බුදු රදුන් අනුමත කළ එම පිළිවෙත වන්නේ,

(1) උපෝසථ විනය කර්මයයි. (2) ආපත්ති ආරෝපනයයි.

(3) ප්‍රාතිමෝක්ෂය දේශනා කිරීමයි. (4) වස්සාවාසයි (5) පිරිවෙස් පිරීමයි.

29. උපසම්පදා ක්‍රම අට අතුරෙන් ''අට්ඨවාචික'' උපසම්පදා ක්‍රමය නමින් හඳුන්වන්නේ,

(1) ගරු ධර්ම අටක් පිළිගැනීමෙන් භික්ෂුණීන්ට ලබාදුන් උපසම්පදාවයි.

(2) අවවාද පිළිගැනීමෙන් සිදු කළ උපසම්පදාවයි

(3) උභතෝ සංඝයා ඉදිරියේ ''ඤත්ති චතුත්ථකම්ම'' විනයකර්මයෙන් සිදුකළ උපසම්පදාවයි.

(4) තිසරණ සරණ ගැන්වීමෙන් ලබා දුන් උපසම්පදාවයි.

(5) දූතයකු මගින් ලබාදුන් උපසම්පදාවයි.

30. පැවිද්ද සම්බන්ධයෙන් යම් යම් සීමා නියමයන් පණවන්නට බුදුරදුන්ට සිදුවිය. එම සීමා නියමයන් වන්නේ,

(1) අඩු වයසේ කුඩා දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.

(2) දෙමාපිය අවසරය නොලත් දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.

(3) රාජකීය පවුල්වල දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.

(4) ස්ව කැමැත්ත නොවිමසා කුල දරුවකු පැවිදි නොකළ යුතුය යන්නයි.

(5) ඥාති පවුල්වල දරුවන් පැවිදි නොකළ යුතුය යන්නයි.

31. බෞද්ධ පබ්බජ්ජාවේ මූලික පරමාර්ථය විය යුත්තේ,

(1) සියලු සංසාරික දුකින් මිදීමයි. (2) මරණින් මතු සුගතිගාමී වීමයි.

(3) කිසිවකුට බරක් නොවී පහසුවෙන් ජීවත් වීමයි (4) පිණ්ඩපාතයෙන් ලැබෙන දෙයකින් යැපීමයි.

(5) සමූහයක් ලෙස සමගියෙන් ජීවත්වීමයි.

32. බුදුන්වහන්සේ උසස් ප්‍රතිපත්ති හා පරමාර්ථ සහිතව පරමාදර්ශී සමාජයක් ලෙස බෞද්ධ භික්ෂු සංවිධානය සකස් කළහ. මෙකී භික්ෂු සංස්ථාවේ ශ්‍රමණයන් හඳුන්වන ලද්දේ,

(1) බාහිත පාපී ශ්‍රමණ යනුවෙනි. (2) අචේලක ශ්‍රමණ යනුවෙනි.

(3) ඒකසාටක ශ්‍රමණ යනුවෙනි. (4) මුණ්ඩක ශ්‍රමණ යනුවෙනි.

(5) ශාක්‍ය පුත්‍ර ශ්‍රමණ යනුවෙනි.

33. මැදුම් පිළිවෙත අනුගමනය කළ බෝසතාණෝ පළමුව ආනාපාන සතිය ද, ඉන්පසු විදර්ශනාවද වඩා ''ත්‍රිවිද්‍යා'' නම් වූ සුවිශේෂී ඤාණ තුනක් උපදවා ගත්හ. එකී ත්‍රිවිද්‍යා ඤාණයන්ට අයත් වන්නේ,

(1) පුබ්බේ නිවාසානුස්සති, දිබ්බසෝත, ආසවක්ඛය ඤාණයන්ය.

(2) පුබ්බේ නිවාසානුස්සති, ආසවක්ඛය, සබ්බඤ්ඤුත ඤාණයන්ය.

(3) පුබ්බේ නිවාසානුස්සති, දිබ්බ චක්ඛු, චතුවේරජ්ජ ඤාණයන්ය.

(4) පුබ්බේ නිවාසානුස්සති, දිබ්බචක්ඛු, ආසවක්ඛය ඤාණයන්ය.

(5) පුබ්බේ නිවාසානුස්සති, දිබ්බචක්ඛු, දිබ්බසෝත ඤාණයන්ය.

34. ආර්‍ය්‍ය අෂ්ටාංගික මාර්ගයේ දක්වෙන ''සම්මා කම්මන්ත'' යනුවෙන් අදහස් කරන්නේ,

(1) කායික වාචසික දුෂ්චරිත වලින් වෙන්වීමයි.

(2) කායික සදාචාරවත් බව රැක ගැනීමයි.

(3) දිවි පැවැත්ම සඳහා කරන වැරදි වලින් වැලකීමයි.

(4) තිදොරින් සිදුවන වැරදි වලින් වැළකීමයි.

(5) සාවද්‍ය කර්මාන්ත වලින් වැළකී යහපත් කර්මාන්ත වලින් මුදල් ඉපයීමයි.

35. තම ශ්‍රාවකයන් පිළිබඳ නිරන්තර අවධානය සහ ඔවුන්ගේ සුවිශේෂී කුසලතා හඳුනා ගැනීම, සුදුස්සාට සුදුසු වගකීම් පවරා දීම ආදිය බුදුන් වහන්සේ තුළ පැවති විශිෂ්ට ශාස්තෘ ගුණාංගයෝ වෙති. මින් ප්‍රකට වන්නේ,

(1) බුදුරදුන් ශ්‍රාවකයන් විෂයෙහි ප්‍රකට කළ මහා කරුණා ගුණයයි.

(2) බුදුරදුන් තුළ පැවති ආගමික සහනශීලීතාවයි.

(3) බුදුරදුන් තුළ පැවති විශිෂ්ට නායකත්වයයි.

(4) බුදුරදුන් තුළ පැවති යථාවාදී තථාකාරී ගුණයයි.

(5) බුදුරදුන් තුළ පැවති ධර්මප්‍රචාරය කිරීමේ විශේෂ හැකියාවයි.

36. තමන් වෙත එළඹෙන ගැටළුවලට පිළිතුරු දීම සඳහා බුදුන්වහන්සේ යොදාගත් ක්‍රමවේදයක් වන්නේ ඒකංසබ්‍යාකරණීය, පටිපුච්ඡාබ්‍යාකරණීය, විභජ්ජබ්‍යාකරණීය හා ඨපනීය යනුයි. මෙහි පටිපුච්ඡාබ්‍යාකරණීය යනුවෙන් අදහස් වන්නේ,

(1) අසන ලද ප්‍රශ්නයට ඍජු පිළිතුරක් දීමයි.

(2) අසන ලද ප්‍රශ්නය විශ්ලේෂණය කොට පිළිතුරු දීමයි.

(3) අසන ලද ප්‍රශ්නයට පිළිතුරු නොදී පසෙකින් තැබීමයි.

(4) අසන ලද ප්‍රශ්නය ප්‍රශ්නයක් මගින් පැහැදිලි කරගෙන පිළිතුරු දීමයි.

(5) අසන ලද ප්‍රශ්නය උපමාරූපක නිදර්ශන මගින් පැහැදිලි කර දීමයි.

37. බුදුන්වහන්සේ ගේ ගුණ කදම්බය වර්ණනා කළ එක්තරා නායක බමුණෙක් සෙසු බමුණ පිරිස ද කැටුව බුදුරදුන් වෙත පැමිණියේය. මෙසේ බුදු රදුන්ගේ ගුණ ගැයූ බමුණා වූයේ,

(1) අග්ගික භාරද්වාජය (2) කසී භාරද්වාජය (3) සුන්දරික භාරද්වාජය

(4) අක්කෝසක භාරද්වාජය (5) සෝණ දණ්ඩය

38. බුද්ධකාලීන භාරතයේ පැවති මුඛ්‍යතම ආගමික සම්ප්‍රදාය දෙක හඳුන්වනු ලබන්නේ,

(1) බෞද්ධ හා නිගණ්ඨ යනුවෙනි. (2) බෞද්ධ හා පරිබ්‍රාජක යනුවෙනි.

(3) නිගණ්ඨ හා ආජීවක යනුවෙනි. (4) ශ්‍රමණ හා බ්‍රාහ්මණ යනුවෙනි.

(5) ආජීවක හා ජටිල යනුවෙනි.

39. බෞද්ධ මූලාශ්‍ර වලින් ප්‍රකටවන සෞන්දර්යාත්මක රසාස්වාදය පිළිබඳ බෞද්ධ ආකල්පය වන්නේ,

(1) සුන්දරත්වය මත පදනම්ව ලබන ආස්වාදයයි.

(2) සොබා දහමේ අසිරිය දැකීමෙන් ලබන ආශ්වාදයයි.

(3) උපාදාන ග්‍රහණයෙන් තොරව ලබන ආශ්වාදයයි.

(4) පංචේන්ද්‍රිය පිනවීමෙන් ලබන ආශ්වාදයයි.

(5) සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම් දැකීමෙන් ලබන ආශ්වාදයයි.

40. සාර්ථක ගිහි ජීවිතයක පැවැත්ම සඳහා අත්ථි සුඛ, භෝග සුඛ අණන සුඛ හා අනවජ්ජ සුඛ යන සිවුවැදෑරුම් ලෞකික සුඛ අවශ්‍ය බව බුදු දහමේ දක්වේ. මේ අතුරෙන් ''අත්ථි'' සුඛ යනුවෙන් හැඳින් වෙන්නේ,

(1) ධාර්මිකව උපයාගත් සම්පත් තමා සතුව ඇතැයි යන සතුටයි.

(2) ධාර්මිකව උපයාගත් සම්පත් අර්ථවත්ව වැයකරමින් මැනවින් පරිභෝග කරමියි ලබන සතුටයි.

(3) ධාර්මිකව උපයාගත් සම්පත් දානාදී යහපත් කටයුතු සඳහා වැය කිරීමෙන් ලබන සතුටයි.

(4) ධාර්මිකව උපයාගත් සම්පත් පරිභෝග නොකොට රැස් කිරීමෙන් ලබන සතුටයි.

(5) ධාර්මිකව උපයාගත් සම්පත් සිය දූ පුතුන්ට බෙදා දී ලබන සතුටයි.

41. ආර්ථික සමෘද්ධිය සඳහා ධනාත්මක අවධානයක් යොමු කරන බුදුසමය ධනය ඉපයීමට අදාළව අත්‍යාවශ්‍ය වන ගුණාත්මක සීමාද දක්වා තිබේ. එවැනි සීමා දෙකක් ලෙස සැලකිය හැක්කේ,

(1) අප්‍රමාදී බව හා උත්සාහයයි.
(2) ධාර්මිකත්වය හා අසාහසිකත්වයයි

(3) අනලස් බව හා සත්‍යවාදී වීමයි.
(4) වෙළඳාමෙහි හා කෘෂිකර්මාන්තයෙහි යෙදීමයි.

(5) කායික ශ්‍රමය හා මානසික ශක්තිය යෙදවීමයි.

42. ගිහියකුට කෘෂිකර්මාන්තය, වෙළඳාම, ගව පාලනය, රාජ්‍ය සේවය වැනි දැහැමි රැකියාවක යෙදී උත්සාහයෙන් ධන සම්පත් උපයා ගනිමින් ධනවතකු වීමට බුදු දහමින් බාධාවක් නැත. එසේ කිරීමේ දී තලාකූට, කංසකූට, මානකූට, උක්කෝටන, වංචන ආදී අධාර්මික ක්‍රම වලින් වැළකිය යුතු බව නිර්දේශකොට ඇත. මේ ඉගැන්වීමෙන් අදහස් කොට ඇත්තේ,

(1) වෙළඳාම් කටයුතු ධාර්මිකව කළ යුතු බවය.

(2) පංචවිධ අධාර්මික වෙළඳාම් වලින් වැළකිය යුතු බවය.

(3) වෙළඳාම මෙන්ම වෙනත් දැහැමි රැකියාවකින් මුදල් ඉපයීම බුදු සමය අනුමත කරන බවයි.

(4) දැහැමිව එහෙත් ලාභ ලැබීමේ පරමාර්ථයෙන්ම වෙළඳාම් කළ යුතු බවයි.

(5) කෘෂිකර්මාන්තය ආදි දැහැමි රැකියාවක නිරත වීම සමාජ සේවයක් ලෙස සලකා සිදුකළ යුතු බවය.

43. ශ්‍රද්ධාව උපදවා ගැනීම නිර්වාණගාමී ප්‍රතිපදාවේ මූලික පියවර ලෙස ද, සසරින් එතරවීම සඳහා පදනමක් වන බවද, අධ්‍යාත්මික කෙතෙහි වපුරන බිජුවට ලෙස ද දක්වා තිබීමෙන් බුදු සමය ශ්‍රද්ධාව අගයකොට ඇති ආකාරය පැහැදිලි වෙයි. මෙහි ලා බුදු සමය ඇගයීමට ලක් කරනු ලබන්නේ,

(1) භක්තිය හා මිශ්‍ර වූ ශ්‍රද්ධාවයි.
(2) භක්තිය හා මුසු වූ අමූලික ශ්‍රද්ධාවයි

(3) සකාරණ වූ ආකාරවතී ශ්‍රද්ධාවයි.
(4) ශක්තිය හා මිශ්‍ර වූ ආකාරවතී ශ්‍රද්ධාවයි.

(5) අමූලික ශ්‍රද්ධාව හා ආකාරවතී ශ්‍රද්ධාව මිශ්‍ර වූ භක්තියයි.

44. බෞද්ධයන් විසින් සදාචාර විරෝධී ක්‍රියා නොකළ යුතු බවත්, සදාචාර ක්‍රියාවල යෙදිය යුතු බවත් අවධාරණය කෙරේ. මෙය සමාදානය හා විරතිය යනුවෙන් ද හැඳින් වේ. විරති සංඛ්‍යාවට ගැනෙන ''අභිජ්ඣාවන් වැළකීම'' යන සදාචාරාත්මක මානසික ක්‍රියාව ඇතුලත් වන්නේ,

(1) පංච ශීලය තුළය.
(2) අෂ්ටාංගික ශීලය තුළය.
(3) දශ ශීලය තුළය.

(4) දස පුණ්‍යක්‍රියා තුළය.
(5) දස කුශලය තුළය.

45. හොඳ නරක විනිශ්චය කිරීමේ බෞද්ධ නිර්ණායකය වන්නේ,

(1) නුවණැත්තන්ගෙන් විමසා හොඳ නරක තීරණය කිරීමය.

(2) ඕනෑම ආගමක් පිළිගත් හොඳ යැයි සම්මත ක්‍රියා කිරීමය.

(3) සිද්ධි වාචක වූ ක්‍රියා සිදු කිරීමය.

(4) හෘදය සාක්ෂියට එකඟව ක්‍රියා කිරීමය.

(5) ආත්මාර්ථයට හේතු නොවුනද පරාර්ථය පිණිස ඉවහල් වේනම් එම ක්‍රියා කිරීමය.

46. සමාජගත ජීවිතයේදී පුද්ගලයා විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් සමුදායක් පෙන්වා දී ඇත. සමාජයේ යහපැවැත්මට හේතු වන එකී යුතුකම් අතුරෙන් පරම්පරාවෙන් උරුමවන සම්පත් රැක ගැනීම.

(1) දෙමාපියන්ගේ වගකීමකි. (2) දරුවන්ගේ වගකීමකි.

(3) ස්වාමිපුරුෂයාගේ වගකීමකි. (4) බිරිඳගේ වගකීමකි. (5) සේවකයන්ගේ වගකීමකි.

47. භික්ෂු භික්ෂුණී උපාසක උපාසිකා යනු බුදු සමය විසින් පිළිගන්නා පරමාදර්ශී සිවුවනක් පිරිසයි. මෙම පිරිස අතුරෙන් ''සාවක සංඝ'' නමින් හැඳින්වෙන පිරිසට අයත් ආර්ය ශ්‍රාවකයෝ,

(1) භික්ෂු සංඝයා තුළ පමණක් සිටිති.

(2) භික්ෂුණී සංඝයා තුළ පමණක් සිටිති.

(3) භික්ෂු භික්ෂුනී උභතෝ සංඝයා තුළ පමණක් සිටිති.

(4) උපාසක උපාසිකා දෙපක්ෂය තුළ පමණක් සිටිති.

(5) සිවුවනක් පිරිස තුළම සිටිති.

48. ජන සම්මතවාදී පාලනයක සාම්ප්‍රදායික මූලධර්ම රැකගනිමින් පාලන කටයුතු සිදු කිරීමෙන් එකී පාලන තන්ත්‍රය පහසුවෙන් බිඳ නොවැටෙන්නේය. යනු බුදු සමයේ පිළිගැනීමයි. එවැනි සාරධර්ම පද්ධතියක් ලෙස හැඳින් විය හැක්කේ,

(1) සතර සංග්‍රහ වස්තුවයි. (2) පංච ශීල ප්‍රතිපදාවයි. (3) සප්ත අපරිහානීය ධර්මයයි.

(4) දසරාජ ධර්මයයි. (5) දස සක්විති මතයි.

49. දීඝනිකායේ කූට දන්ත සූත්‍රයේ දැක්වෙන මහා විජිත රජතුමාගේ පුරෝහිත බමුණාගේ ප්‍රකාශයට අනුව රටක පවත්නා සොරසතුරු අර්බුදයක් විසඳාගැනීමෙහි ලා බුදු සමය ඉදිරිපත් කරන දේශපාලන ක්‍රමෝපාය ලෙස දැක්වෙන්නේ,

(1) රාජ්‍ය අයබදු නොගෙන සිටීමය. (2) නීතිරීති දැඩි කිරීමය.

(3) දුරාචාරවල නොයෙදෙන ලෙසට උපදෙස් ලබා දීමය.

(4) දිළින්දන්ට ධනය බෙදා දීමය

(5) ජනතාවගේ ආර්ථික ශක්තිය දියුණු කිරීම පිණිස නිසි විධිවිධාන යෙදීමය.

50. හොඳ නරක තෝරා බේරාගෙන කටයුතු කිරීමට පුද්ගලයාට ස්වච්ඡන්දතාවක් ඇතැයි ද, යම් ක්‍රියාවක් ආරම්භ කිරීමටත්, නොකඩවා පවත්වාගෙන යාමටත්, බාධා ජයගැනීමටත් හැකියාව ඇතැයි ද අවධාරණය කරයි. මෙමගින් තහවුරු වන්නේ,

(1) පුද්ගලනිරවද්‍යතාව පිළිගන්නා බවයි. (2) පුද්ගල ශක්‍යතාව පිළිගන්නා බවයි.

(3) පුද්ගල අනන්‍යතාව පිළිගන්නා බවයි. (4) පුද්ගල අර්ථ සිද්ධිය පිළිගන්නා බවයි.

(5) පුද්ගල ඒකාබද්ධතාව පිළිගන්නා බවයි.

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උ/පෙළ) විභාගය

බෞද්ධ ශිෂ්ටාචාරය - II

13 ශ්‍රේණිය

කාලය පැය 03 යි.

- I කොටසින් ප්‍රශ්න දෙකක්ද, II කොටසින් ප්‍රශ්න තුනක්ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

I කොටස

01. (i) ක්ෂත්‍රිය වර්ණයට අයත් ස්වධර්ම නම් කරන්න.

(ii) බ්‍රාහ්මණ වර්ණයට නියමිත ආපද්ධර්ම පෙන්වා දෙන්න.

(iii) වෛදික සාහිත්‍යයට අයත් ග්‍රන්ථ පහක් නම් කරන්න.

(iv) කාන්තාව සිය ජීවිත කාලයට පිරිමි පක්ෂය යටතේ ජීවත් විය යුතු යැයි දැක්වූ බ්‍රාහ්මණ නියමය ගෙනහැර දක්වන්න.

(v) බුදු සමයෙන් කාන්තාවට හිමිකර දුන් ආගමික ස්වාධීනත්වය උදාහරණ දෙකක් මගින් පැහැදිලි කරන්න.

02. (i) ෂට් ශාස්තෘවරුන් සහ ඔවුන්ගේ දර්ශන නම් වශයෙන් දක්වන්න.

(ii) පකුධ කච්චායන ශාස්තෘවරයා ඉදිරිපත් කළ සප්ත පදාර්ථ සංකල්පය නම් කරන්න.

(iii) අජිත කේශකම්බල ශාස්තෘවරයා ඉදිරිපත් කළ දසවස්තුක මිත්‍යා දෘෂ්ටිය හඳුන්වන්න.

(iv) නිගණ්ඨනාත පුත්ත ශාස්තෘවරයා කර්මය අටවැදෑරුම් කොට උගන්වයි. එය හඳුන් වන්න.

(v) ජෛන දහමෙහි එන පංච සීල ප්‍රතිපදාව දක්වන්න.

03. (i) ''රාජ්‍යයේ ප්‍රභවය'' පිළිබඳ බෞද්ධ ඉගැන්වීම අග්ගඤ්ඤ සූත්‍රයට අනුව කෙටියෙන් දක්වන්න.

(ii) බුද්ධකාලීන භාරතයේ පැවති ප්‍රධාන රාජාණ්ඩු හතර සහ ඒවා පාලනය කළ රජවරු නම් කරන්න.

(iii) බුදුරදුන් දවස භාරතීය සමාජය කෘෂි ආර්ථික රටාවකට නැඹුරුව සිටි බවට සාධක හතරක් පෙන්වා දෙන්න.

(iv) රාජ්‍ය පාලනය සඳහා අනුගමනය කළ යුතු කරුණු ලෙස බුදු දහමින් ඉදිරිපත් කරනු ලබන උපදෙස් පහක් නම් කරන්න.

(v) සතර අගතිය කෙටියෙන් හඳුන්වන්න.

II කොටස

- **මෙම කොටසින් ප්‍රශ්න 03 ක් තෝරාගන්න. එක් පිළිතුරක කොටස් 4 කි. එක කොටසකට ලකුණු 5 ක් හිමිවේ.**

04. (i) බුදු දහමින් නිර්දේශිත ධනෝපායන මාර්ග කවරේ දැයි පෙන්වා දෙන්න.

(ii) ''ධන පරිභෝජනයේදී සමාර්ථය මෙන්ම පරාර්ථය ද සැලකිය යුතු බව බුදු දහම අවධාරණය කරයි.'' කරුණු දක්වන්න.

(iii) බෞද්ධ ඉගැන්වීම් මගින් මිනිස් ශ්‍රමය ඇගයීමට ලක්කොට ඇති ආකාරය පරීක්ෂා කරන්න.

(iv) ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දැක්වෙන චතුර්විධ සම්පදා පිළිබඳ ඉගැන්වීම පුද්ගලයාගේ ලෞකික අභිවෘද්ධියට කෙසේ උපයෝගී කරගත හැකි දැයි විමසීමක් කරන්න.

05. (i) සිඟාලගේ සදිසා නමස්කාරයට බුදු රදුන් නව අරුතක් සපයා දී ඇති ආකාරය පෙන්වා දෙන්න.

(ii) දැහැමි සමාජයක් ගොඩනැගීම පිණිස ගිහි පැවිදි සම්බන්ධය පිළිබඳව බෞද්ධ ඉගැන්වීම් ඉවහල්වන අයුරු පරීක්ෂා කරන්න.

(iii) හොඳ නරක විනිශ්චයෙහිලා බුදු දහමේ උගන්වා ඇති නිර්ණායක පෙන්වා දෙන්න.

(iv) සාමකාමී සුඛිත මුදිත සමාජයක් ඇති කිරීම විෂයෙහි අල්පේච්ඡතාව ඉවහල් වන අයුරු විස්තර කරන්න.

06. (i) බුදුන්වහන්සේ ගේ සුවිශේෂී හැකියාවක් වූ ''පුරිස දම්ම සාරථි'' ගුණය නිදසුන් දක්වමින් පෙන්වා දෙන්න.

(ii) බුද්ධ චරිතයෙන් ප්‍රකට වන පද්මාකාර ජීවිතය සනිදර්ශනාත්මක ව විස්තර කරන්න.

(iii) ''ශාස්තෘවරයකු වශයෙන් බුදුරදුන් තුළ පැවති ආගමික සහනශීලීත්වය උන්වහන්සේගේ ක්‍රියාකාරිත්වය තුළින් ප්‍රකට වෙයි.'' සනාථ කරන්න.

(iv) බුදුන්වහන්සේ තුළ පැවති විශිෂ්ට ගුණාංග සමකාලීනයන්ගේ ඇගයීමට ලක් වූ ආකාරය නිදසුන් තුනක් මගින් පැහැදිලි කරන්න.

07. (i) බෞද්ධ පබ්බජ්ජාවේ ක්‍රමික විකාශය පැහැදිලි කරන්න.

(ii) භික්ෂු සමාජයේ ක්‍රියාත්මක වන පරමාදර්ශී ලක්ෂණ හඳුන්වා දෙන්න.

(iii) බුදුරදුන් බෞද්ධ භික්ෂුවට හඳුන්වා දුන් ශ්‍රමණ ආකල්පවල සුවිශේෂත්වය පෙන්වා දෙන්න.

(iv) වස් විසීමේ චාරිත්‍රයෙහි ආරම්භය හා විකාශය විස්තර කරන්න.

08. (i) බුද්ධ කාලීන භික්ෂු සමාජය තුළ පැන නැගී තිබුණු ගැටළු මොනවා දැයි දක්වන්න.

(ii) ප්‍රථම ධර්ම සංගීතිය බුදු සමයේ චිරස්ථිතියට ඉවහල් වූ ආකාරය පැහැදිලි කරන්න.

(iii) බුදු සමයේ උන්නතියට බුද්ධ කාලීන භාරතීය ප්‍රභූ පන්තිය දැක්වූ දායකත්වය විස්තර කරන්න.

(iv) බුද්ධ කාලීන භාරතය තුළ බුදු දහම ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වීම කෙරෙහි භික්ෂු, භික්ෂුණී, ශ්‍රාවකයන්ගෙන් ලැබුණු අනුග්‍රහය උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ල. 5 x 20 = 100)